

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
இலங்கை இராணுவம்
Sri Lanka Army

කාර්ය සාධන වාර්තාව - 2021
வருடாந்த செயல்திறன் அறிக்கை - 2021
PERFORMANCE REPORT - 2021

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2021

පටුන

1 වන පරිච්ඡේදය	ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය
2 වන පරිච්ඡේදය	ප්‍රගතිය හා ඉදිරි දැක්ම
3 වන පරිච්ඡේදය	2021.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය
4 වන පරිච්ඡේදය	කාර්ය සාධන දර්ශක
5 වන පරිච්ඡේදය	තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය
6 වන පරිච්ඡේදය	මානව සම්පත් පැතිකඩ
7 වන පරිච්ඡේදය	අනුකූලතා වාර්තාව

1 වන පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ගොඩබිම් ක්‍රියාන්විත සඳහා වන විශාලතම හමුදා සේවය වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වූ කලී දේශයේ ඒකීයත්වය, ස්වෛරීත්වය හා භෞමික අඛණ්ඩත්වය සුරැකීමෙහි ප්‍රධාන වගකීමෙන් බැඳුණු ආයතනයක් වේ. තම රාජකාරී ඉහළ වෘත්තීමයභාවයකින් යුතුව ඉටු කරමින් සාමකාමී පරිසරයක් නිර්මාණය කිරීමට සහ රාජ්‍යයේ ආරක්ෂාව සහ සෙසු කටයුතු වලට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අසමසම දායකත්වයක් දරනු ලැබේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

යුද්ධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ සියලු නිලයන්ට යුද්ධ හමුදාවේ දැක්ම පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු වේ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දැක්ම පහත පරිදි වේ.

''වෘත්තීමයභාවය, විශ්වසනීයත්වය හා ගෞරවනීයත්වය තුළින් විජයග්‍රාහී හමුදාවක්''

1.3 ප්‍රධාන කාර්යන්

අ. සන්නද්ධ හමුදාවන්හි විශාලතම බලකාය/හමුදාව වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රීලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාව ආරක්ෂා කර ගැනීමට සහ එය පිළිගැනීමට බැඳී සිටී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාර්යභාරය පහත පරිදිය:

(1) අභ්‍යන්තරික හා බාහිර ගැටුම් වලින් මාතෘ භූමිය සුරක්ෂිත කරමින් එහි ස්වෛරීභාවය, භෞමික අඛණ්ඩතාවය හා ජාතික සමඟිය ආරක්ෂා කිරීම, වත්මන් තර්ජන වලට සහ කලහකාරී ක්‍රියාවලට එරෙහිව එය වැළැක්වීමේ බලකායක් ලෙස කටයුතු කිරීම.

(2) අභ්‍යන්තර තර්ජන හමුවේ කටයුතු කිරීම සඳහා රජයේ අනුබද්ධිත ආයතන වලට සහාය වීම සහ ජාතික ව්‍යසන, ආපදා හා හදිසි අවස්ථාවන්හිදී සිවිල් අධිකාරීන්ට සහයෝගය ලබාදීම.

ආ. අභ්‍යන්තරික හා බාහිර තර්ජන හමුවේ මාතෘ භූමියෙහි ගෞරවය, ඒකීයත්වය, ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාවය පවත්වාගෙන යාමේ අරමුණින් රාජකාරී ඉටු කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව බැඳී සිටී. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදිය:

(1) සම්භාවිතාව සහිත තර්ජනයන් දුරදර්ශීව හඳුනා ගැනීම හා ඒ සඳහා ක්‍රියාකාරී පිළිවෙත් යොදා ගැනීම.

(2) බහු නිපුණතා සහිත මනාව සූදානම් වූ හටපිරිස් විෂමාකාර තර්ජනයන් වැළැක්වීම උදෙසා පවත්වා ගැනීම.

(3) පුහුණුව තුළින් යුධමය හා සාමකාමී වාතාවරණයන් තුළ අවශ්‍ය ක්‍රියාන්විත හැකියාවන් පවත්වාගෙන යෑම.

(4) පූර්ණ ගැටුම්කාරී ස්වභාවයන් හි සියලු ආකාර ක්‍රියාන්විතයන්හි නිරතවීමට වගබලා ගැනීම.

(5) ආපදා තත්වයන් තුළ එම තත්වයන්ගෙන් මිදීමටත් සහන සැපයීමත් උදෙසා රාජ්‍ය අංශයේ බලධාරීන් හට සහාය වීම.

(6) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තියට හා අවබෝධතා ගිවිසුම් වලට අනුකූලව සාමසාධක රාජකාරීන්හි නිරත වීම.

(7) සිවිල් ජන සමාජයෙහි පරිපාලනය අඩාල වන අන්දමින් ඇතිවිය හැකි නොසන්සුන් වාතාවරණ, කැරළි ස්වභාවයන් තුළ නීතිය හා සාමය පවත්වා ගැනීම උදෙසා සහාය ලබාදීම.

(8) රාජ්‍ය අනුග්‍රහය යටතේ ආරම්භ කරන ලද ජාතිය ගොඩනැංවීමේ වැඩසටහන් සඳහා සහාය ලබාදීම.

(9) අවශ්‍ය වූ අවස්ථාවන්හිදී විදෙස් රාජ්‍යයන් සඳහා මානුෂික ආධාර ලබාදීම.

1.4 සංවිධාන ව්‍යුහය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථාන සංවිධාන ව්‍යුහය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා කේෂ්ත්‍ර සංවිධාන ව්‍යුහය

යුද්ධ හමුදා මූලස්ථානය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථාන

යුද්ධ හමුදා මූලස්ථානය



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුහුණු සංස්ථා

ශ්‍රී ලංකා යුද්ධ හමුදා පුහුණු මධ්‍යස්ථාන



2 වන පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව එහි ආරම්භයේ සිටම මාතෘ භූමියට එල්ල විය හැකි ඕනෑම ආකාරයක බාහිර හා අභ්‍යන්තර තර්ජනවලට එරෙහිව ක්‍රියාකරන විශ්වාසවන්තම හා ප්‍රමුඛතම බලවේගය බවට අද වනවිට පත් වී හමාරය. ජාතික ප්‍රගමනය වෙනුවෙන් විවිධාකාර අයුරින් දායකත්වය දක්වා ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, සාම්ප්‍රදායික හමුදාවක කාර්යභාරයෙන් ඔබ්බට ගොස් ජාතියේ ආරක්ෂකයා ලෙස තම මූලික සන්නද්ධ රාජකාරිය ඉටුකර මව්බිමට ගෞරවයක් ලබාදී ඇත.

2. යුද්ධ හමුදාව වෙත ජාතික ආරක්ෂාව, ආපදා තත්වයන්ට මුහුණදීම, කොවිඩ් වසංගතය හා ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘති ආදී ක්ෂේත්‍ර ගණනාවක් තුළ පැවරුණු වගකීම් හා රාජකාරීන් නිසි ආකාරයෙන් ඉටුකරමින් සිටින්නේ එය ශ්‍රී ලංකාවේ වඩාත්ම සංවිධානාත්මක ආයතනය බව ශ්‍රී ලංකා වාසීන්ට මෙන්ම ලෝවාසීන්ට ද පසක් කරමිනි.

3. කොවිඩ් වසංගතය පාලනය කිරීමට අදාළ කාර්යයන්හිදී හා එන්නත්කරණ වැඩසටහන් වලදී යුද්ධ හමුදාවට පැවරුණු වගකීම සහ අභියෝග ඉතාමත් සාර්ථකව ඉටුකිරීම සමස්ත රටවැසියන් තුළ යුද්ධ හමුදාව කෙරෙහි ඇති ප්‍රසාදය තවත් ඉහළ නැංවීමට හේතුවිය.

4. වර්තමානයේ අතිගරු ජනාධිපති තුමන්ගේ **'රට හදන සෞභාග්‍යයේ දැක්ම'** ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව රට සංවර්ධනය කිරීමේ ජාතික ක්‍රියාන්විතයේ විශේෂිත කාර්යභාරයක් යුද්ධ හමුදාවට පැවරී ඇත. ඒ අනුව යුද්ධ හමුදාව ජාතිය ගොඩනැංවීමේ ව්‍යාපෘතිය ඇතුලු ව්‍යාපෘති රාශියක් සාර්ථකව අවසන් කරමින් පවතියි. එමෙන්ම අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රතිපත්තියක් වන ශ්‍රී ලංකාව තුළ හරිත කෘෂි කර්මාන්තයක් බිහිකිරීම සඳහා යුද්ධ හමුදා මූලස්ථානයේ ප්‍රධානත්වයෙන් යුතුව **හරිත කෘෂිකර්ම ක්‍රියාන්විත මධ්‍යස්ථානයක්ද** ස්ථාපනය කරන ලදි. රටේ නව කෘෂිකාර්මික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ වගකීම මෙම ක්‍රියාන්විත මධ්‍යස්ථානයට පවරා තිබීම මඟින් රණවිරුවන් කෙරෙහි මෙරට වැසියන් තුළ නිර්මාණය වී ඇති විශ්වාසය නැවත වරක් තහවුරු කිරීමකි.

5. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් එළිදැක්වූ '**2020 - 2025 යුද්ධ හමුදා පස් අවුරුදු මූලෝපායික සැලැස්ම**' අනුව නවීන තත්වයන් හා කාලෝචිත අවශ්‍යතාවයන් හඳුනාගෙන යුද්ධ හමුදාව යාවත්කාලීන කිරීම ඉතාමත් සාර්ථකව ක්‍රියාත්මක කෙරෙමින් පවතියි. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තම භයිපිරිස් මනා කළමනාකරණය කරමින් පහත සඳහන් ආයතන නවතමයෙන් ස්ථාපිත කරන ලද අතර එම ආයතනයන්හි කාර්යයන් හා කාර්යභාරයන් සංක්ෂිප්තව මෙසේ දැක්විය හැක.

ඇ. **<u>යුද්ධ හමුදා මූලික රෝහල (මහනුවර).</u> ආරක්ෂක සේනා මූලස්ථානය (මධ්‍යම)** ප්‍රදේශයෙහි සක්‍රීය සේවයේ නියුතු යුද්ධ හමුදා නිලධාරීන්/සෙසුනිලයින්/සිවිල් සේවක මහතුන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් සහ විශ්‍රාමික හමුදා සාමාජිකයන්ගේ සෞඛ්‍ය තත්වය ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාමට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම සඳහා 2021 ඔක්තෝබර් මස 10 වන දින යුද්ධ හමුදා මූලික රෝහල (මහනුවර) පිහිටුවන ලද අතර එහි කාර්යයන් පහත පරිදි වේ.

(1) <u>ප්‍රතිකාර</u>.

(අ) බාහිර, නේවාසික හා දන්ත වෛද්‍ය ප්‍රතිකාර සැපයීම.

(ආ) විශේෂඥ වෛද්‍ය සායනික පහසුකම් සැපයීම.

(ඇ) වෛද්‍ය හා දන්ත පරීක්ෂණ පහසුකම් සැපයීම.

(ඈ) රෝගීන් සඳහා අවශ්‍ය වෛද්‍ය හා ශල්‍ය වෛද්‍ය පහසුකම් සැපයීම.

(ඉ) ඖෂධ, සැරහුම් හා වෛද්‍ය උපකරණ ගබඩා පහසුකම් පවත්වාගෙන යාම.

(ඊ) අවශ්‍යතාව අනුව ද්විතීයික හා තෘතීයික වෛද්‍ය පහසුකම් ලබාදිය යුතු රෝගීන් එම පහසුකම් ඇති රෝහල් කරා මාරුකිරීම.

(උ) යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද පුල්හිම්ස් පරීක්ෂණ, වෛද්‍ය පරීක්ෂණ පැවැත්වීම සහ ප්‍රථමාධාර පහසුකම් සැපයීම.

(ඌ) යුද්ධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්ෂ විසින් අනුමත කරන ලද පහත් වෛද්‍ය වර්ග කිරීම් මත සිටින අයවලුන් සඳහා වෛද්‍ය මණ්ඩල පැවැත්වීම.

(එ) හදිසි ආපදා අවස්ථාවන් සඳහා කඩිනමින් යොමු කළ යුතු වෛද්‍ය කණ්ඩායම් පුහුණු කිරීම හා වෛද්‍ය උපකරණ සමඟින් ඒ සඳහා යොමු කිරීම.

(ඒ) වෛද්‍ය කාර්යය මණ්ඩලය හා අනෙකුත් යුද්ධ හමුදා සාමාජිකයින් සඳහා මූලික හා උසස් පුහුණුව ලබාදීම.

(2) **<u>රෝග නිවාරණය</u>.** යුද්ධ හමුදා නිවාරණ වෛද්‍ය හා මානසික සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අධීක්ෂණය යටතේ රෝග නිවාරණ වෛද්‍ය පහසුකම් ලබාදීම.

(3) යුද්ධ හමුදාධිපති විසින් පවරනු ලබන ඕනෑම කාර්යයක් ඉටුකිරීම.

ආ. **<u>අතිරේක ප්‍රහාරක බලකාය</u>.** උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යුද්ධ හමුදාධිපතිගේ අතිරේක ප්‍රහාරක බලකාය ලෙස කටයුතු කිරීමට සහ ද්විතියික කාර්ය වශයෙන් හදිසි ආපදා අවස්ථාවන්වලදී මානුෂීය ආධාර හා ආපදා සහන (HADR) ක්‍රියාකාරකම් සඳහා විවිධ වූ පරිසර තත්වයන් යටතේ මෙහෙයුම් සිදුකිරීම සඳහා 2021 ජූලි මස 16 වන දින අතිරේක ප්‍රහාරක බලකාය පිහිටුවන ලද අතර මෙම බලකායෙහි කාර්යයන් පහත පරිදි වේ.

(1) **<u>ප්‍රාථමික කාර්යයන්</u>**. යුද්ධ හමුදාධිපතිවරයාගේ මහ පෙන්වීම මත ක්ෂණික මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම මඟින් සතුරන් විනාශ කර දැමීම සහ ජාතික ආරක්ෂාවට ඇති තර්ජන වළක්වා ගැනීම සඳහා කඩිනම් ප්‍රතිචාරයකට සූදානම්ව සිටීම.



(අ) සියලුම මෙහෙයුම් සඳහා අතිරේක ප්‍රහාරක බලකාය සංග්‍රාමිකව සූදානම්ව තැබීම.

(ආ) අණ සහ උපදෙස් මත උපායමාර්ගික, ආක්‍රමණශීලී හා ආරක්ෂිත ක්‍රියාත්විත සිදුකිරීම.

(ඇ) උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශේෂ මෙහෙයුම් බලකායන් යෙදවීම තුළින් විශේෂ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.

(ඈ) අවස්ථානුකූලව නියෝගයන්ට අනුව ප්‍රතිකැරලිකාර මෙහෙයුම්, ප්‍රතිත්‍රස්තවාදී මෙහෙයුම් සහ ප්‍රතිඅන්තවාදී මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම.

(ඉ) අවස්ථානුකූලව අදාළ නියෝගයන්ට අනුව අභ්‍යන්තර ආරක්ෂක රාජකාරී ඉටු කිරීම.

(ඊ) වෙරලාශ්‍රිත, නොගැඹුරු දියඹේ හා අභ්‍යන්තර ජල මාර්ගයන්හි මෙහෙයුම් කටයුතු සිදුකිරීම.

(උ) එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමට සූදානම්ව සිටීම.

(2) **<u>ද්විතියික කාර්යයන්</u>**. යුද්ධ හමුදාපති විසින් දෙනු ලබන උපදෙස් පරිදි හදිසි ආපදා අවස්ථාවන් වලදී මානුෂීය ආධාර සහ ආපදා සහන (HADR) ක්‍රියාකරකම් සඳහා විවිධ වූ පරිසර තත්වයන් යටතේ පහත දක්වා ඇති මෙහෙයුම් සිදුකිරීම.

(අ) ආපදා අවස්ථාවන්ට ක්ෂණික ප්‍රතිචාර දැක්වීම සහ මානුෂීය ආධාර සැපයීම සඳහා සිවිල් බලධාරීන්ට සහාය වීම.

(ආ) අවශ්‍ය ඕනෑම මොහොතක හමුදා සහාය රජයේ ආයතනයන්ට, සිවිල් බලධාරීන්ට හා ජනතාවට ලබාදීම (MACA).

(ඇ) සෙවීමේ සහ ගලවා ගැනීමේ සංග්‍රාමික මෙහෙයුම් සිදුකිරීම.

(ඈ) යුද්ධ හමුදාපති විසින් පවරනු ලබන වෙනත් ඕනෑම කාර්යයක් ඉටු කිරීම.

ඇ. **<u>ජාතික අවශ්‍යතාවයන් මත භයිපිරිස් කළමනාකරණය</u>**. රජය විසින් ක්‍රියාත්මක කරන අත්‍යවශ්‍ය එළවලු වර්ග, කිරි නිෂ්පාදනය සහ ධාන්‍ය වර්ග වලින් මෙරට ස්වංපෝෂිත කිරීම හා ශ්‍රී ලංකාව තුළ හරිත කෘෂි කර්මාන්තයක් බිහිකිරීම මූලික අරමුණ කර ගෙන 2020 වර්ෂයේ පිහිටුවන ලද ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය වෙත 2021 වර්ෂයේදී වැඩි පිරිස්බල ප්‍රමාණයක් අනුයුක්ත කරන ලදි.



7. සමස්ත ශ්‍රී ලාංකිකයන් මෙන්ම ජගත් ප්‍රජාව විසින් අපේක්ෂිත වගකීම් රැසක් ඉටුකරනු ලබන ශ්‍රී ලංකා යුද්ධ හමුදාව 2020 වසරෙහි ලද දියුණුව හා අත්දැකීම් පිළිබඳ සමාලෝචනය කරමින් **‘2020 - 2025 යුද්ධ හමුදා පස් අවුරුදු මූලෝපායික සැලැස්ම’** කරා යන ගමනේ 2021 වසරෙහි විවිධ ක්ෂේත්‍රයන්හි ලද ප්‍රගමනය තවදුරටත් සහතික කරමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අපේක්ෂිත අරමුණු ළඟාකර ගනිමින් සිටියි.

<u>ඉදිරි දැක්ම</u>

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් එහි ආරම්භයේ සිටම ආදර්ශමත් හා පරාර්ථකාමී සේවාවක් මඟින් මෙරට පුරවැසියන්ගේ විශ්වසනීයත්වය දිනාගනිමින් ජාතික ආරක්ෂාව සුරක්ෂිත කරන ලදි. ජාතික ආරක්ෂාවෙහි සමාජ සංස්කෘතික පැතිකඩ පිළිබඳ අවධානය යොමුකරමින් සාමය, ආර්ථික ප්‍රගතිය, ජාතිය ගොඩනැගීම, සංවර්ධනය සහ ජනතාවගේ ජීවන රටාව සුරක්ෂිත කර ගැනීම සඳහා අභ්‍යන්තර හා බාහිර තත්වයන් තුළින් ඇති වන සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන තර්ජන වලට එරෙහිව කටයුතු කිරීමට මෙන්ම භූමියේ ස්වෛරීභාවය හා භෞමික අඛණ්ඩතාව සුරක්ෂිත කිරීම වෙනුවෙන් යුද්ධ හමුදාව විධිමත් සංවිධානභාවයකින් හා පූර්ණ සූදානම්භාවයකින් යුක්ත විය යුතුය. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් අනාගතයේදී ප්‍රධාන වශයෙන් කාර්යයන් දෙකක් සිදුකිරීමට බැඳී ඇත. ඉන් පළමුවැන්න වර්තමානයේ එල්ල විය හැකි සාම්ප්‍රදායික තර්ජන වලට එරෙහිව කටයුතු කිරීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට අවශ්‍ය සූදානම් බව තහවුරු කිරීම වේ. දෙවැන්න බෙදුම්වාදී ත්‍රස්තවාදයන්ගේ මතුවීම සහ ප්‍රචණ්ඩ අන්තවාදය ඇතුලුව සිදුවිය හැකි සාම්ප්‍රදායික නොවන තර්ජන වලින් මෙරට සුරක්ෂිත කිරීමය.

2. **<u>සාධක 7 කින් සමන්විත ප්‍රවේශය.</u>** ජාතියේ ප්‍රගතිය උදෙසා සාමකාමී වාතාවරණයක් පවත්වාගෙන යාම ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි ප්‍රධානතම කාර්යභාරය බවට පත්ව ඇත. ඒ සඳහා වර්තමාන හා අනාගත ආරක්ෂක පරිසරයන්, ප්‍රවණතා, තර්ජන හා අභියෝග පිළිබඳ අවධානය යොමු කරමින් දේශයේ සුරක්ෂිතභාවය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි ක්‍රියා සැලැස්ම ඇතුළත්ව යුද්ධ හමුදාවේ දැක්ම, හර පද්ධතීන්, අරමුණු හා උපායමාර්ග පිළිබඳ දැක්වෙන **‘2020 - 2025 යුද්ධ හමුදා පස් අවුරුදු මූලෝපායික සැලැස්ම’** හඳුන්වා දෙන ලදි. එම සැලැස්ම ඉලක්කගත සාධක 7 කින් සමන්විත ඇති අතර එය සවිස්තරාත්මකව පහත පරිදි දැක්විය හැක.



ප්‍රස්ථාරය 2.1. සාධක 7 කින් සමන්විත ප්‍රවේශය

අ. **<u>ජාතික ආරක්ෂාව</u>**. නැඟී එන අභියෝග හඳුනා ගැනීම සහ මාතෘ භූමියෙහි ආරක්ෂක අවශ්‍යතා සපුරාලීමට අවශ්‍ය ශක්‍යතා හා නිපුණත්වය අනුවර්තනය කර ගැනීම සඳහා වන ක්‍රියාමාර්ග අනුගමනය කරමින් ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමෙහි ලා ප්‍රමුඛ දායකත්වය සපයන්නා ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාව අඛණ්ඩව කටයුතු කරනු ඇත.

(1) **<u>මෙහෙයුම් සඳහා වන සූදානම්භාවය</u>**. රාජ්‍යයේ ආරක්ෂක අවශ්‍යතා සපුරාලීම සඳහා සූදානම්භාවය පවත්වාගෙන යාම වෙනුවෙන් යුද්ධ හමුදාව සතු බහුශ්‍රැතභාවය හා සඵලතාව අත්‍යවශ්‍ය වේ. උපායමාර්ගික ස්ථානගතකරණය, ශක්‍යතා වර්ධනය, මෙහෙයුම් ඉලක්කගත පුහුණුව හා අනාගත අභියෝග තක්සේරු කළ හැකි උපාය මාර්ගික අධ්‍යාපනය මඟින් එය ළඟා කර ගත හැක. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ චිරස්ථායි හර පද්ධතිය පිළිබඳව මනා දැනුවත්භාවය මඟින් සිදුවන සුභවාදී ආකල්පමය පරිවර්තනය පුහුණුවෙහි පදනම වනු ඇත.

(2) **<u>හමුදාව නවීකරණය කිරීම</u>**. මෙහෙයුම් පරිසරය තුළ නැඟී එන සංකීර්ණතා වලට මුහුණදීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ධාරිතාවය සහ හැකියාවන් වැඩිදියුණු කිරීමේ උපාය මාර්ගය කෙරෙහි අවධානය යොමුකළ යුතුය. ඉහළ සංග්‍රාමික කාර්යක්ෂමතාවයක් ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය උපාය මාර්ග වර්ධනය කිරීමේදී යුද්ධ හමුදාව නවීකරණය කිරීම අත්‍යවශ්‍ය අංගයකි. මෙහි අවසන් අරමුණ වන්නේ සාමය, සංවර්ධනය සහ ජාතික ප්‍රගමනය ප්‍රවර්ධනය හා ස්ථාවරභාවය පත් කරන ප්‍රවණ්ඩත්වයෙන් තොර පරිසරයක් සහතික කරන්නෙකු බවට යුද්ධ හමුදාව පත්කිරීමයි.

(3) **<u>සියලුම නිල කළමනාකරණ හා වෘත්තීය ප්‍රගමනය</u>**. ආයතනයෙහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත් සංවිධානය කිරීමට සහ උත්තේජනය කිරීමට සමත් විනිවිදභාවයෙන් යුත් අඛණ්ඩ වෘත්තීය සැලැස්මක් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් සිදුකරනු ලබයි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවෙහි සියලුම නිලයන්ගේ වෘත්තීය සැලසුම්කරණය හා සංවර්ධන ක්‍රියාවලියේදී ආයතනික පුහුණුව, මෙහෙයුම් පැවරුම් සහ ස්වයං වෘත්තීය සංවර්ධනය යන අංගයන්හි මනා සමතුලිතභාවයක් තිබිය යුතුය.

(4) **<u>සාමාජිකයින්ගේ සුභසාධනය</u>**. ආයතනය කෙරෙහි විශ්වාසය, ගරුත්වය, පක්ෂපාතීත්වය මෙන්ම විශ්වාසය ප්‍රවර්ධනය සඳහා සුබවාදී හා දිරිගන්වනසුළු වැඩ පරිසරයක් නිර්මාණය කිරීම, කීර්තිනාමය පවත්වාගෙන යාම සහ යුද්ධ හමුදාවේ ප්‍රතිරූපය ගොඩනැඟීම සඳහා දැනට සේවයේ නියුතු, විශ්‍රාමලත්, තුවාල ලැබුවන්ගේ සහ යුධ භූමියේදී රණකීර්තියට පත්වුවන්ගේ පවුල් වල සාමාජිකයින්ට අවධානය යොමුකරමින් ඔවුන් රැකබලා ගැනීම ඉතා වැදගත් වේ.

(5) **<u>ගෞරවනීය විශ්‍රාමික ජීවිතය</u>**. ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විශ්‍රාමික හමුදා සාමාජිකයන්ගේ යහ පැවැත්ම හා ගෞරවය සහතික කරනු ලැබේ. යුද්ධ හමුදාවෙහි සමස්ත ප්‍රතිරූපය ගොඩනැංවීමෙහිලා මෙන්ම, යුද්ධ හමුදාවෙහි විශ්වසනීයත්වය, පක්ෂපාතීත්වය, සහයෝගීතාවය හා ගෞරවය ඇති කිරීමෙහිලා මෙය ප්‍රමුඛ කරුණක් බවට පත් වේ. දේශයේ යහපැවැත්ම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා සාමාජිකයන් විසින් දිවිහිමියෙන් සිදුකරනා ලද කැපකිරීම හඳුනාගැනීම සඳහා ඔවුනට ගෞරවාන්විත විශ්‍රාම දිවියක් සහතික කිරීම ඉතා වැදගත් වේ.

(6) **<u>ජාතිය ගොඩනැගීම සහ සංහිඳියාව</u>**. ඕනෑම අවස්ථාවක පූර්ණ සූදානම්භාවයකින් යුතු විශාලතම සංවිධානයක් වන ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට තරහකාරී බව හා මනා විනය ආවේණික ගුණාංග වේ. ජාතියේ සංවර්ධනය සහතික කිරීම හා තිරසාර සාමය හා ආර්ථික සංවර්ධනය ළඟාකර ගැනීම අරමුණ ඇතිව ජාතිය ගොඩනැංවීම, ජාතික උරුම සංරක්ෂණය සහ සංහිඳියාව සඳහා රජය දරන විශාල ප්‍රයත්නයන්ට ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් අඛණ්ඩව සහාය ලබාදෙනු ලැබේ. '**2020 - 2025 යුද්ධ හමුදා පස් අවුරුදු මූලෝපායික සැලැස්ම**' මඟින් ළඟාකර ගැනීමට අපේක්ෂිත අරමුණු හා එහි බලපෑම මෙසේ දැක්විය හැක.

3 වන පරිච්ඡේදය

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තත්‍ය නැවත ගලපන ලද 2021 රු.	2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අග්‍රිම		204,005,786,000	189,185,968,573	ඒසීඒ-3
-	පෙර වසරේ අග්‍රිම ශේෂය		220,442,864	213,968,438	
-	තැන්පතු		322,885,627	1,603,564,445	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		2,478,250,949	1,020,663,856	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**207,027,365,440**	**192,024,165,312**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**207,027,365,440**	**192,024,165,312**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**996,977,958**	**1,828,059,976**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**206,030,387,482**	**190,196,105,336**	

	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
136,372,320,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	136,368,926,235	129,787,363,869	
36,774,970,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	36,344,974,195	30,679,302,018	ඒසිඒ-2(ii)
281,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	267,902,050	291,984,237	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	349,879	
173,428,290,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**172,981,802,480**	**160,759,000,003**	
	මූලධන වියදම්				
635,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	377,515,460	384,877,250	
6,661,882,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	3,244,136,784	1,644,045,367	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,100,000,000	හැකියා වර්ධනය	**14**	1,067,404,507	462,174,992	
1,612,000,000	වෙනත් මූලධන වියදම්	**15**	1,315,691,948	604,093,789	
10,008,882,000	**මුළු මූලධන වියදම් (උ)**		**6,004,748,699**	**3,095,191,398**	
-	තැන්පතු ගෙවීම්		323,497,157	1,599,027,073	ඒසිඒ-4
-	අත්තිකාරම් ගෙවීම්		2,501,317,649	706,301,104	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**2,824,814,806**	**2,305,328,177**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		181,811,365,985	166,159,519,578	
183,437,172,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**24,219,021,497**	**24,036,585,758**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		24,087,791,553	23,816,142,894	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		131,229,944	220,442,864	ඒසිඒ-3
			24,219,021,497	**24,036,585,758**	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021	**2020**
		රු.	**රු.**
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	87,525,046,736	131,208,491,240
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	3,182,273,336	3,142,868,531
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	131,229,944	220,442,864
මුළු වත්කම්		**90,838,550,016**	**134,571,802,635**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		3,070,044,317	3,047,027,982
දේපළ පිරියත හා උපකරණ සංචිතය		87,525,046,736	131,208,491,240
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**	17,000,000	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	95,229,019	95,840,549
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	131,229,944	220,442,864
මුළු වගකීම්		**90,838,550,016**	**134,571,802,635**

සීමාන්විතයි

පිටු අංක....10...සිට ..34.. දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..35.... සිට ....95... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
කමල් ගුණරත්න ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ජෙනරල් (විශ්‍රාමික)
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
2022 පෙබරවාරි මස 22 දින

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය
ශ්‍රී ජයවර්ධනපුර
කෝට්ටේ

.....
ගණන්දීමේ නිලධාරි
එල් එච් එස් සී සිල්වා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ජෙනරාල්
යුද්ධ හමුදාධිපති
2022 පෙබරවාරි මස 21 දින

ජෙනරාල්
යුද්ධ හමුදාධිපති

.....
~~ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/~~
අධ්‍යක්ෂ (මුදල්) ~~/කොමසාරිස් (මුදල්)~~
කේඩීඑන් කරුණාතිලක
ශ්‍රී ලංකා යුද්ධ හමුදාව
2022 පෙබරවාරි මස 21 දින

කේඩීඑන් කරුණාතිලක
අධ්‍යක්ෂ මුදල්
ශ්‍රීලංකා යුද්ධ හමුදාව

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
		නැවත ගලපන ලද
	2021	**2020**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	7,285,100,380	7,629,986,823
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	5,434,244,427	4,789,614,259
අග්‍රිම ලැබීම්	204,226,228,864	189,399,937,011
අත්තිකාරම් අයකර ගැනීම්	2,478,250,949	1,020,114,407
තැන්පතු ලැබීම්	322,885,627	1,603,564,445
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**219,746,710,247**	**204,443,216,945**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	172,713,900,430	160,467,015,766
සහනාධාර සහ මාරුකිරීම්	267,902,050	291,984,237
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	36,807,136,360	35,934,296,447
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	996,977,958	1,828,059,976
අත්තිකාරම් ගෙවීම්	2,501,317,649	706,575,304
තැන්පතු ගෙවීම්	323,497,157	1,599,027,073
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**213,610,731,604**	**200,826,958,803**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ) = (අ)-(ආ)	**6,135,978,643**	**3,616,258,142**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූදල් ප්‍රවාහය (ඇ)	**-**	**-**
අඩුකළා: මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	6,004,748,699	3,095,191,398
මහා භාණ්ඩාගාරය විසින් අග්‍රිම ගිණුමට යොදන ලද ජර්නල්	-	300,623,880
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**6,004,748,699**	**3,395,815,278**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(6,004,748,699)**	**(3,395,815,278)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(උ)=(ඇ) + (ඊ)	**131,229,944**	**220,442,864**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**131,229,944**	**220,442,864**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**131,229,944**	**220,442,864**

3.4 **මූල්‍ය ප්‍රකාශ සටහන්**

අ. **වාර්තාකිරීමේ පදනම**

(1) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

(2) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

(3) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(4) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

(5) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

(6) **මුදල් හා මුදල් සමාන දෑ**

2021 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

(7) **මූල්‍ය ප්‍රකාශන ආකෘතියෙහි සිදුකරන ලද වෙනස්කම් හා පෙර වර්ෂයේ සංසන්දනාත්මක අගයන් නැවත ගැලපීම.**

2021 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශන ආකෘතිවල සිදුකරන ලද වෙනස්කම් අනුව 2020 වසර සඳහා වන සංසන්දනාත්මක සංඛ්‍යාවල අදාළ ගැලපුම් සිදුකර ඇත.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

ආදායම් කේතය					ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
						මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
(අ)	(ආ)	(ඇ)	(ඈ)	(ඉ)	(ඊ)	(උ)	(ඌ)	(එ)	(ඒ)
2002	0	1	0	1				31,803,842.17	
2002	0	1	0	99				14.68	
2002	0	2	0	99				135,715,780.08	
2003	0	1	0	0				316,469.80	
2003	0	3	0	2				31,761,871.31	
2003	0	6	0	0				996,470,446.98	
2003	0	99	0	0				341,808,533.72	
2004	0	1	0	0				5,691,213,482.56	
2006	0	2	0	1				33,357,484.84	
2006	0	2	0	2				22,652,454.00	
එකතුව								**7,285,100,380.14**	

3.6 **වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය**

ප්‍රතිපාදන වර්ගය	ප්‍රතිපාදන		සත්‍ය වියදම (රු.)	ප්‍රතිපාදන භාවිතය අවසන් ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
	මූලික (රු.)	අවසන් (රු.)		
පුනරාවර්තන	163,307,970,000	173,428,290,000	172,981,802,481	99.74%
ප්‍රාග්ධන	6,465,000,000	10,008,882,000	6,004,748,698	59.99%

3.7 <u>මුදල් රෙගුලාසි **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල නියෝජිතයකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන</u>

අනු අංකය	ප්‍රතිපාදන වෙන්කර දුන් දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය	ව්‍යාපෘති/වැඩ සටහන නම	ප්‍රතිපාදන ප්‍රමාණය		මුළු වියදම	ප්‍රතිපාදන උපයෝජනය
			මූලික ප්‍රතිපාදන ප්‍රමාණය	මුළු ප්‍රතිපාදන ප්‍රමාණය		
1	ජනාධිපති ලේකම් කාර්යාලය	මිද්දෙණිය ප්‍රාථමික විද්‍යාලය ඉදිරිපිට ගුවන් පාලම ඉදිකිරීම	16,470,129.60	14,150,279.84	18,327,291.44	130%
		ත්‍රී/මැදවච්චිය(බක්මීගම) විද්‍යාලයේ ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණය කිරීම	132,190.14	1,594,605.31	1,398,934.35	88%
		බදුල්ල, හල්දුම්මුල්ල, කුමාරතැන්න මහජන ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කිරීම	969,785.31			
		වළල්ලාවිට, යට්ටපාත, 7 කණුව මහජන ක්‍රීඩාංගණය ප්‍රතිසංස්කරණය කිරීම	1,707,083.87			
		දික්වැල්ල - බතිගම රෝහල කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම	592,777.00	592,777.00	311,460.12	53%
		ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ කුමාරතැන්න ග්‍රාමයේ සරත් මහතාගේ නිවස ඉදිකිරීම සඳහා	401,960.50	401,960.50	401,960.50	100%
		විහාර හල්මිල්ලෑව විහාරස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම	2,127,736.00	2,127,736.00	2,127,346.00	100%
2	ආරක්ෂක අමාත්‍යාංශය	ජාතික ශිෂ්‍යභට බලකාය වෙත නිල ඇඳුම් ලබාදීම	737,100.00	737,100.00	964,188.35	131%
		ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානි කාර්යාලයේ වාහන නඩත්තු කිරීම සඳහා	300,000.00	800,000.00	772,808.42	97%
		යුද්ධ හමුදා මූලස්ථානය සඳහා අවැසි ආරක්ෂක උපකරණ මිළදි ගැනීමට	62,732,529.41	62,732,529.41	35,584,693.55	57%
		ජාතික ශිෂ්‍යභට බලකායේ රංටැඹේ පුහුණු මධ්‍යස්ථානය සඳහා නවාතැන් පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා	4,458,354.92	5,997,121.32	2,448,916.91	41%
		යුද්ධ හමුදා පතොරොම් ගබඩා (පුනානි) සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු සඳහා	400,000,000.00	400,000,000.00	269,521,432.65	67%
		උපාය මාර්ගික ආරක්ෂක සන්නිවේදන ජාල ව්‍යාපෘතියේ ලග්ගල සන්නිවේදන කුළුණේ ප්‍රවේශ මාර්ගය අළුත්වැඩියා කිරීම සඳහා	19,034,111.80	13,112,635.35	13,068,391.63	100%

අනු අංකය	ප්‍රතිපාදන වෙන්කරදුන් දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය	ව්‍යාපෘති/වැඩ සටහන නම	ප්‍රතිපාදන ප්‍රමාණය		මුළු වියදම	ප්‍රතිපාදන උපයෝජනය
			මූලික ප්‍රතිපාදන ප්‍රමාණය	මුළු ප්‍රතිපාදන ප්‍රමාණය		
3	ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ සිදුකරනු ලබන පාසල් ක්‍රීඩා පිටි සංවර්ධන ව්‍යාපෘති	60,747,324.00	25,736,074.53	24,294,467.73	94%
4	ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	බිම්වෙඩි ඉවත් කිරීමේ රාජකාරීන් සඳහා	14,431,383.00	14,431,383.00	14,421,839.94	100%
5	අධිකරණ අමාත්‍යාංශය	අධිකරණ අමාත්‍යතුමාගේ නිල නිවස නවීකරණය කිරීම සඳහා	1,348,837.50	1,494,796.74	1,022,379.88	68%
6	බන්ධනාගාර මූලස්ථානය	කළුතර, මහර හා මීගමුව බන්ධනාගාර ආයතන සඳහා ආරක්ෂක කැමරා පද්ධති සවිකිරීම සඳහා	14,558,625.00	14,558,625.00	14,637,625.00	101%
		බන්ධනාගාර පරිශ්‍රයන්හි අර්ධ ස්ථාවර ගොඩනැඟිලි ඉදිකිරීම	46,874,197.98	49,025,152.00	49,183,868.67	100%
		වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා රැඳවියන් සිටින ස්ථානයේ ආරක්ෂිත වැටක් ඉදිකිරීම සඳහා	216,625.00	216,625.00	6,832.20	3%
7	බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	යාපනය, කන්කසන්තුරේ නිස්ස විහාරස්ථානයේ සංඝාවාසය ඉදිකිරීම සඳහා	11,644,080.00	13,444,158.03	10,347,259.39	77%
		මාන්කුලම්, මුලතිව්, ශ්‍රී සුගත විහාරස්ථානයේ සංඝාවාසය ඉදිකිරීම සඳහා				
		කනගරායංකුලම් ශ්‍රී සම්බුද්ධරාජ විහාරස්ථානයේ සංඝාවාසය ඉදිකිරීම සඳහා				
		මන්නාරම්, සීලාවතුර, ශ්‍රී විජයනිලක විහාරස්ථානයේ සංඝාවාසය ඉදිකිරීම සඳහා				
		වාවකච්චේරි, නාවත්කුලිය, සම්ද්ධි සුමන විහාරයේ සංඝාවාසය ඉදිකිරීම සඳහා				
		ඔලබොඩුව ශ්‍රී ජයවර්ධනාරාම රජ මහා විහාරස්ථානයේ දහම් පාසල් ගොඩනැඟිල්ල ඉදිකිරීම සඳහා	3,344,082.98	3,344,082.98	3,336,658.37	100%

අනු අංකය	ප්‍රතිපාදන වෙන්කර දුන් දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය	ව්‍යාපෘති/වැඩ සටහන නම	ප්‍රතිපාදන ප්‍රමාණය		මුළු වියදම	ප්‍රතිපාදන උපයෝජනය
			මූලික ප්‍රතිපාදන ප්‍රමාණය	මුළු ප්‍රතිපාදන ප්‍රමාණය		
8	කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසැල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසැල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය	කොළඹ හා කුරුණෑගල ආරක්ෂක සේවා විද්‍යාලයන්හි සැපයුම් හා සේවාවන් සඳහා ප්‍රතිපාදන ලබාදීම	27,500,000.00	4,381,166.00	4,381,165.76	100%
		"ගම සමඟ පිළිසඳරක්" වැඩසටහන යටතේ සිදුකරනු ලබන ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන ලබාදීම	47,697,053.39	47,697,053.39	27,413,544.45	57%
9	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව	රියදුරු බලපත් මුද්‍රණ කටයුතු සඳහා	694,968,310.00	694,968,310.00	391,095,354.78	56%
		මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ගොඩනැඟිලි වැඩිදියුණු කිරීම සඳහා	1,700,000.00	2,100,000.00	1,987,199.14	95%
		මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සඳහා	137,000,000.00	137,000,000.00	19,567,014.00	14%
		මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ගොඩනැඟිලි ඉදිකිරීම කටයුතු සඳහා	10,044,000.00	10,044,000.00	5,340,000.00	53%
මුළු එකතුව			**1,581,738,277.40**	**1,520,688,171.40**	**911,962,633.23**	**60%**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2021** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	33,449,620,345.23	33,449,620,345.23	-	100%
9152	යන්ත්‍රෝපකරණ	13,697,310,677.95	13,697,310,677.95	-	100%
9153	ඉඩම්	32,376,195,960.14	32,376,195,960.14	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	35,644,020.77	35,644,020.77	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	61,059,120.00	61,059,120.00	-	100%
9160	කෙරීගෙන යන වැඩ	7,905,817,061.64	7,905,817,061.64	-	100%
9180	බදුදෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

2021 වර්ෂයට අදාළ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙයට ඇමුණුම වශයෙන් ඉදිරිපත් කර ඇත.

4 වන පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වැය ශීර්ෂය	විස්තරය	විශේෂ නිර්නායක	සත්‍ය ප්‍රගතිය පුරෝකථනය කරන ලද ප්‍රතිඵලයේ ප්‍රතිශතයක් ලෙස		
			100% - 90%	75% - 89%	50% - 74%
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම					
222-01-1-2001	ගොඩනැඟිලි හා ඉදිකිරීම්	අළුත්වැඩියා කල ගොඩනැඟිලි ප්‍රමාණය		✔	
222-01-3-2001	ගොඩනැඟිලි හා ඉදිකිරීම්	අළුත්වැඩියා කල ගොඩනැඟිලි ප්‍රමාණය		✔	
222-01-3-2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			✔
222-01-3-2003	වාහන	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			✔
මූලධන වත්කම් අත්පත් කරගැනීම					
222-01-3-2102	ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			✔
222-01-3-2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			
222-01-3-4-2103	සන්නිවේදන පද්ධතිය වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			
222-01-1-2104	ගොඩනැඟිලි හා ඉදිකිරීම්	ඉදිකර ඇති ගොඩනැඟිලි ප්‍රමාණය			✔
222-01-3-2104	ගොඩනැඟිලි හා ඉදිකිරීම්	ඉදිකර ඇති ගොඩනැඟිලි ප්‍රමාණය		✔	
222-01-3-2105	ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	අත්පත්කරගෙන ඇති ඉඩම්			
විශේෂ සංවර්ධන ව්‍යාපෘති					
222-01-1-5-2104	යුද්ධ හමුදා රෝහල (පියවර 3)	වැඩ අවසන් කිරීමේ ප්‍රතිශතය		✔	
222-01-1-10-2104	පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ ප්‍රධාන මළඅපද්‍රව්‍ය බැහැරකිරීමේ පද්ධතිය ඉදිකිරීම	වැඩ අවසන් කිරීමේ ප්‍රතිශතය			
222-01-1-12-2104	යුද්ධ හමුදා කාන්තා බලකාය සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදිකිරීම (බොරැල්ල)	වැඩ අවසන් කිරීමේ ප්‍රතිශතය			✔
222-01-1-13-2104	මහල් තුනකින් සමන්විත මධ්‍යම අවි ගබඩා ගොඩනැඟිල්ල	වැඩ අවසන් කිරීමේ ප්‍රතිශතය			
පුහුණු කිරීම් හා හැකියා වර්ධනය					
222-01-1-2401	පුහුණු කිරීම් හා හැකියා වර්ධනය	පුහුණු සෙබළ සංඛ්‍යාව	✔		
අනෙකුත් මූලධන වියදම්					
222-01-1-1-2509	ආදායම් උපදවනු ලබන වාණිජ ව්‍යාපෘති	සත්‍ය වියදමේ ප්‍රතිශතය			✔
222-01-1-3-2509	එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව		✔	
ණය යෝජනා ක්‍රම					
222-01-3-2-2509-12	ඉන්දියානු ණය යෝජනා ක්‍රමය	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව	✔		
222-01-3-2-2509-17	ඉන්දියානු ණය යෝජනා ක්‍රමය	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව	✔		
222-01-3-3-2509-12	පාකිස්තානු ණය යෝජනා ක්‍රමය	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			
222-01-3-3-2509-17	පාකිස්තානු ණය යෝජනා ක්‍රමය	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			
222-01-3-5-2509-12	ප්‍රතිත්‍රස්ථවාද වැලැක්වීම සහ ආරක්ෂාකරණය (GOSL - India)	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			
222-01-3-5-2509-17	ප්‍රතිත්‍රස්ථවාද වැලැක්වීම සහ ආරක්ෂාකරණය (GOSL - India)	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			
විශේෂ අයවැය යෝජනා ව්‍යාපෘති					
222-01-3-06-2101	වාහන	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			
222-01-3-06-2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	ක්‍රියාකාරී තත්වයේ පවතින සංඛ්‍යාව			
222-01-3-06-2104	ගොඩනැඟිලි හා ඉදිකිරීම්	ඉදිකර ඇති ගොඩනැඟිලි ප්‍රමාණය			✔

සටහන:

සත්‍ය ප්‍රගතිය පුරෝකථනය කරන ලද ප්‍රතිඵලයේ ප්‍රතිශතය 50% අඩු වැය ශීර්ෂයන් මෙහි හිස්ව තබා ඇත.

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

පුනරාවර්ථන වැය ශීර්ෂ

වැය විෂය	වැය විස්තරය	විශේෂ නිර්ණායක	සත්‍ය ප්‍රගතිය පුරෝකථනය කරන ලද ප්‍රතිඵලයේ ප්‍රතිශතයක් ලෙස		
			100% -90%	75% - 89%	50% - 74%
පුද්ගලික පඩි නඩි					
1001	වැටුප් හා වේතන	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1002	අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප්	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1003	වෙනත් දීමනා	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
ගමන් වියදම්					
1101	ගමන් වියදම් (දේශීය)	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1102	ගමන් වියදම් (විදේශීය)	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
වෙනත් සැපයුම්					
1201	ලිපි ද්‍රව්‍ය කාර්යාලීය අවශ්‍යතා	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1202	ඉන්ධන හා ලිහිසි තෙල්	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1203	ආහාර හා නිල ඇඳුම්	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1204	වෛද්‍ය සැපයුම්	සත්‍ය වියදමේ ප්‍රතිශතය		✓	
1205	වෙනත් සැපයුම්	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
නඩත්තු වියදම්					
1301	වාහන	සත්‍ය වියදමේ ප්‍රතිශතය		✓	
1302	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	සත්‍ය වියදමේ ප්‍රතිශතය		✓	
1303	ගොඩනැඟිලි හා සැළසුම්	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
වෙනත් සේවා					
1401	ප්‍රවාහන	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1402	තැපැල් හා සන්නිවේදන	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1403	පාරිභෝජන සේවා	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1404	බදු කුළි සහ පළාත් පාලන බදු	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1409	වෙනත්	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
මාරුකිරීම්					
1501	සුභසාධන වැඩසටහන්	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1506	දේපළ ණය පොළී	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1508	වෙනත්	සත්‍ය වියදමේ ප්‍රතිශතය	✓		
1701	කපාහැරීම්	සත්‍ය වියදමේ ප්‍රතිශතය			

5 වන පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2021 භෞතික ප්‍රගතිය	2021 වර්ෂයේ ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය		
				0%–49%	50%-74%	75%-100%
සාගින්න නැති කර, ආහාර සුරක්ෂිතතාවය සහ යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.						
සීමාන්තික වශයෙන් ආහාර මිළ උච්ඡාවචනය වීම වැළැක්වීමට ආහාර සංචිත ද ඇතුළත්ව ආහාර නිෂ්පාදන වෙළඳපොළවල් සහ ඒවායේ අතුරු නිෂ්පාදන නියමිත ආකාරයෙන් ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම	1. විවිධ මහා පරිමාණ කෘෂි, පළතුරු, පශු හා වෙනත් දේශීය ආහාර නිෂ්පාදන ව්‍යාපෘති සිදුකිරීම	1.1 වාර්ෂිකව වී, එලවලු, බඩඉරිහු, කජු, දේශීය අඹ, විවිධ ධාන්‍ය, කුළු බඩු වගා කිරීම. වාර්ෂිකව කිරි, බිත්තර, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය කිරීම	1.1.1 වගාකළ අක්කර ගණන/බෝග වශයෙන් අක්කර 2,277.5		✓	
			1.1.2 ඵලදාව කිලෝ ගණන/බෝග වශයෙන්		✓	
			1.1.3 භාණ්ඩාගාර ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කළ වටිනාකම රු. 893,069.72			
	2. අපනයන ඉලක්ක කරගත් කෘෂිකර්මාන්තය	2.1 වාර්ෂිකව බෝග වගා කිරීම	2.1.1 වගා කරන ලද අක්කර ගණන	✓		
			2.1.2 නිෂ්පාදිත ප්‍රමාණය බෝග වශයෙන්	✓		
			2.1.3 අපනයන ආදායම	✓		
	3. දියර කිරි ජීවානුහරණය කිරීම හා දියර කිරි යොදාගනිමින් අගය එකතුකල නිෂ්පාදන හඳුන්වා දීම	3.1 දියර කිරි යොදගනිමින් අගය එකතුකල නිෂ්පාදන සංඛ්‍යාවක් හඳුන්වා දීම	3.1.1 ජීවාණුහරණය කරන ලද දියර කිරි ලීටර් ගණන - 47,909.28			✓
			3.1.2 අගය එකතුකල කිරි නිෂ්පාදන වටිනාකම රු. 3,832,743.00			
	4. බිත්තර අවශ්‍යතාවය ලබාදීම	4.1 වාර්ෂිකව අවශ්‍යතාවය සපුරාලීම සඳහා යුද්ධ හමුදා ගොවිපල වල ලේයර් සතුන් 25,000 ක් යෙදවීම	4.1.1 නිෂ්පාදනය කරන ලද බිත්තර ගණන - 4,176,551			✓
			4.1.2 ලේයර් සතුන් සංඛ්‍යාව - 25,000			✓
	5. ශ්‍රී ලංකා ලුණු සංස්ථාව සමඟ එක්ව නිෂ්පාදනය ආරම්භ කිරීම	5.1. ශ්‍රී ලංකා ලුණු සංස්ථාව සමඟ එක්ව වාර්ෂිකව ලුණු නිෂ්පාදනය කිරීම සහ සහනදායී මිළට ලබාදීම	5.1.1 නිෂ්පාදනය කරන ලද ලුණු ප්‍රමාණය - ක්‍රි: ග්‍රෑ 67,601			✓
			5.1.2 වාර්ෂිකව විකුණුම් ආදායම රු: 3,298,188.60			✓
2030 වන විට තිරසර ආහාර නිෂ්පාදන පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පැවතීම තහවුරු කිරීම සහ ජෛව පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන්නා වූ, කාලගුණ වෙනස්වීම් වලට හැඩගැසීම සඳහා වූ ධාරිතාවන් ශක්තිමත් කරන්නා වූ හානිකර කාලගුණ තත්ත්වයන්, නියහ, ගංවතුර සහ වෙනත් ආපදාවන් සහ ඉඩම් සහ පසේ ගුණාත්මක තත්ත්වයන් වර්ධනය කරන්නා වූ ඔරොත්තු දිය හැකි කෘෂිකාර්මික භාවිතාවන් ක්‍රියාවට නැංවීම	1. අවශ්‍ය කැලෑ සළාක මළු ආනයනය කිරීම සම්පූර්ණයෙන්ම නතර කර කැලෑ සළාක මළු නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම	1.1 වාර්ෂිකව යුද්ධ හමුදා ගොවිපල කන්දකාඩු වෙතින් කැලෑ සළාක මළු නිෂ්පාදනය කිරීම	1.1.1 නිෂ්පාදනය කරන ලද කැලෑ සළාක මළු සංඛ්‍යාව - 78,975		✓	
	2. වස විසෙන් තොර ආහාර නිෂ්පාදනයට දායක වීම	2.1 වාර්ෂිකව කාබනික පොහොර නිෂ්පාදනය	2.1.1 නිෂ්පාදනය කරන ලද කාබනික පොහොර ප්‍රමාණය	✓		
			2.1.2 නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය - මෙට්‍රික්ටොන් 11,133.09	✓		
		2.2 වාර්ෂිකව කාබනික පොහොර යොදා බෝග වගා කිරීම	2.1.1 කාබනික පොහොර යෙදූ වගා භූමි ප්‍රමාණය - 1138.52			
	3. රසායනික පොහොර භාවිතය සීමා කිරීම හේතුවෙන් සියළු යුද හමුදා ගොවිපල කේන්ද්‍ර කර ගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය	3.1 වාර්ෂිකව කොම්පෝස්ට් නිෂ්පාදන කර ශ්‍රී ලංකා පොහොර සංස්ථාව වෙත ලබාදීම	3.1.1 නිෂ්පාදනය කරන ලද කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය - මෙට්‍රික්ටොන් 185.521	✓		

ප්‍රතිපත්ති ඉලක්ක	උපායමාර්ග	ඉලක්කය/දර්ශකය	2021 භෞතික ප්‍රගතිය	2021 වර්ෂයේ ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රතිශතය		
				0%-49%	50%-74%	75%-100%
නිරෝගී ජීවිත සහතික කර සෑම වයසකම සිටින සියල්ලන්ගේම සුභසාධනය ප්‍රවර්ධනය කිරීම						
3.4 2023 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මඟින් හා වළක්වා ගැනීමේ ක්‍රම මඟින් තුනෙන් එකකින් අඩුකර ගැනීම සහ මානසික සෞඛ්‍යය සහ සහ පැවැත්ම ප්‍රවර්ධනය කිරීම	1. ඇඳන් 861,දැඩි සත්කාර ඇඳන් 6 කින් හා හදිසි ප්‍රතිකාර ඒකකයේ ඇඳන් 67කින් යුත් නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහල මඟින් වෛද්‍ය පහසුකම් සැපයීම (15 මහලකින් යුත් වාට්ටු සංකීර්ණයෙහි ඉදිකිරීම් කටයුතු මූලික මට්ටමේ පවතියි)	1.1 බාහිර රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීම	1.1.1 සාමාන්‍ය දෛනික බාහිර රෝගීන් සංඛ්‍යාව			
		1.2 නේවාසික රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීම	1.2.1 සාමාන්‍ය දෛනික නේවාසික රෝගීන් සංඛ්‍යාව			
		1.3 දැඩිසත්කාර ඒකක සේවාවන් සැපයීම	1.3.1 සාමාන්‍ය දෛනික දැඩිසත්කාර රෝගීන් සංඛ්‍යාව	✓		
			1.3.2 මසකට සැත්කම් සංඛ්‍යාව	✓		
		1.4 නේවාසික කොවිඩ් රෝගී ප්‍රතිකාර	1.4.1 සාමාන්‍ය දෛනික කොවිඩ් රෝගීන් සංඛ්‍යාව			
			1.4.2 මහල් 15 කින් යුත් වාට්ටු සංකීර්ණයෙහි ඉදිකිරීම් කටයුතු මූලික මට්ටමේ පවතියි			
	2. නව හමුදා රෝහල ඉදිකිරීම	2.1 පල්ලේකැලේ ඉදිකරනු ලබන යුහ රෝහල ඉදිකිරීම (ඉදිකිරීම් කටයුතු අවසන් අදියරයේ පවතියි)	2.1.1 ප්‍රතිලාබ ලබන අයවළුන් ගණන යුද්ධ හමුදා සාමාජිකයින් 32,000 පමණ පවුල් වල සාමාජිකයින් - 100,000 පමණ		✓	
